# ජාතික රාජ්‍ය සභාවේ

# 1974 අංක 11 දරන මග්ගොන

# තරුණ බෞද්ධ සංගමය පනත

[සහතිකය සටහන් කලේ 1974 අප්‍රේල් මස 18 වන දින]

---

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

(1974 මැයි මස 3 වැනි දින ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී).

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 11 දරන මග්ගොන තරුණ බෞද්ධ සංගමය පනත

[සහතිකය සටහන් කළේ 1974 අප්‍රේල් මස 18 වන දින]

එල්. ඩී.—ඕ. 71/91.

**මග්ගොන තරුණ බෞද්ධ සංගමය නීතිගත කිරීම සඳහා වූ පනතකි.**

මග්ගොන තරුණ බෞද්ධ සංගමය යනුවෙන් නම් කෙරුණු හා හැඳින්වුණු සංගමයක් එහි සාමාජිකයන් විසින් එකඟ වූ රීති අනුව එකී සංගමයට සම්බන්ධ සියලු කරුණු ඵලදායී ලෙස කරගෙන යාමේ හා ක්‍රියාත්මක කිරීමේ කාර්යය සඳහා මෙතෙක් කල් මග්ගොන පිහිටුවා තුබූ හෙයින් ද: පූර්විකාව.

එකී සංගමය පිහිටුවනු ලැබුවේ යම් පරමාර්ථ හා කරුණු සඳහා ද ඒ පරමාර්ථ හා කරුණු එකී සංගමය විසින් මෙතෙක් කල් සාර්ථක ලෙස කරගෙන ගොස් ක්‍රියාත්මක කර ඇති හෙයින් හා නීතිගත කිරීම සඳහා ඉල්ලුම් කර ඇති හෙයින් ද ඒ ඉල්ලීමට ඉඩ දීම මහජන යහපත පිණිස වන හෙයින් ද:

ශ්‍රී ලංකා ජනරජයේ ජාතික රාජ්‍ය සභාව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත ජාතික රාජ්‍ය සභාවේ 1974 අංක 11 දරන මග්ගොන තරුණ බෞද්ධ සංගමය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මේ පනත ආරම්භවීමේ දින සිට හා පසු එකී මග්ගොන තරුණ බෞද්ධ සංගමයේ සභාපති, උපසභාපතිවරු හා පාලක මණ්ඩලයේ සාමාජිකයන් ද එකී මග්ගොන තරුණ බෞද්ධ සංගමයේ සාමාජිකයන් ව දැනට සිටින යම් හා සිටිනතාක් තැනැත්තන් හෝ මෙයින් සංස්ථාපනය කරනු ලබන සංස්ථාවට මින් මතු ඇතුළත් කර ගනු ලබන සාමාජිකයන් "මග්ගොන තරුණ බෞද්ධ සංගමය" යන අභිධානය හා නාමය යටතේ සදා කල් අඛණ්ඩව පවතින සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් එයට අවිච්ඡින්න පැවැත්මක් තිබිය යුතු ය. තව ද සියලු බලය හා බලාධිකාරය ඇතුව සියලු අධිකරණයන් හි එකී සංගමය විසින් නඩු පැවරිය හැකි අතර එයට විරුද්ධව නඩු පවරනු ලැබිය හැකි ය. එමෙන්ම එකී සංගමය විසින් පොදු මුද්‍රාවක් පාවිච්චි කළ යුතු අතර එහි අභිමතය පරිදි ඒ මුද්‍රාව වෙනස් කළ හැකි ය. නීතිගත කිරීම.

3. සංස්ථාව සංස්ථාපනය කරනු ලබන්නේ යම් පොදු පරමාර්ථ සඳහා ද ඒ පරමාර්ථ මෙයින් මෙසේ ප්‍රකාශ කරනු ලැබේ:— පරමාර්ථ.

(අ) බෞද්ධයින් අතර අන්‍යෝන්‍ය මෛත්‍රිය, සදාචාරය හා සමගිය වර්ධනය කිරීම; බෞද්ධයින්ගේ පොදු සුභසිද්ධිය;

(ආ) බෞද්ධාගම ව්‍යාප්ති කිරීම; බෞද්ධ හා ජාතික අධ්‍යාපනය නැංවීම; බෞද්ධයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම;

(ඇ) බෞද්ධයින් විසින් බුද්ධ ධර්මය වඩාත් හොඳින් පිළිපැදීම සඳහා ක්‍රම හා මාර්ග යොදා ගැනීම; බෞද්ධ කටයුතුවලට ආධාර දීම.

1—ඒ 00698—8912 (73/8)

රීති.

4. (1) මෙහි උපලේඛනයෙහි දැක්වෙන රීති සියලු කාර්යයන් සඳහා සංස්ථාවේ රීති විය යුතු ය:

එසේ වුව ද සංස්ථාව විසින්, යථා පරිදි සංයුක්ත වූ යම් මහා සභා රැස්වීමක දී අලුත් රීති සෑදීම හෝ උපලේඛනයෙහි දැක්වෙන හෝ සංස්ථාව විසින් මින් මතු සාදනු ලබන රීතිවලින් යමක් වෙනස් කිරීම, සංශෝධනය කිරීම හෝ ඒවාට යමක් එකතු කිරීම හෝ ඒවා ඉන් යමක් අවලංගු කිරීම කළ හැකි ය.

(2) කිසිම අලුත් රීතියක් සෑදීම හෝ උපලේඛනයෙහි දැක්වෙන හෝ මින් මතු සාදනු ලබන කිසිම රීතියක් වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ අවලංගු කිරීම, දින විසිඅටකට නො අඩු කාලයකට පෙර විශේෂ යෝජනාවක් මාර්ග යෙන් දැනුම් දීමෙන් විනා, හා ඒ කාර්යය සඳහා විශේෂයෙන් කැඳ වනු ලැබූ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන් අතුරෙන් තුනෙන් දෙකකට නො අඩු වැඩි ඡන්දයෙන් ඒ යෝජනාව සම්මත කරනු ලබන්නේ නම් මිස, නො කළ යුතු ය.

ණය යනාදිය.

5. මේ පනත ක්‍රියාත්මක වන අවස්ථාවෙහි පවත්නා එකී මග්ගොන තරුණ බෞද්ධ සංගමයේ සියලුම ණය හා වගකීම් සංස්ථාව විසින් ගෙවිය යුතු අතර එකී සංගමයට අය විය යුතු හා ගෙවනු ලබන සියලුම ණය හා සියලු දායක මුදල් හා සම්මාදම් මුදල් එකී සංස්ථාවට ගෙවිය යුතු ය.

සංස්ථාවේ මුද්‍රාව.

6. යටත් පිරිසෙයින් සංස්ථාවේ සභාපති හා එහි ලේකම් හෝ භාණ්ඩාගාරික හෝ යන දෙදෙනාගෙන් කෙනෙක් ඉදිරිපිට දී හැර කිසිම නීත්‍යනුකූල ලේඛනයකට සංස්ථාවේ මුද්‍රාව නො තැබිය යුතු අතර තමන් සිටි බවට ලකුණක් වශයෙන් ඒ දෙදෙනා ඒ නීත්‍යනු කූල ලේඛනයට අත්සන් තැබිය යුතු ය. තව ද ඒ අත්සන් තැබීම සාක්ෂිකරුවකු වශයෙන් යම් තැනැත්තකු අත්සන් තැබීමෙන් ස්වාධීනව විය යුතු ය.

සංස්ථාව විසින් දේපළ යනාදිය දැරිය යුතු බව.

7. (1) සංස්ථාවේ අරමුණු හා පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීමෙහි ලා තත් කාලයෙහි බලපවත්නා සංස්ථාවේ රීතිවලට යටත් ව යම් ගිවිසුමකට ඇතුලුවීමේ අයිතිවාසිකම හා බලය සංස්ථාවට තිබිය යුතු ය.

(2) යම් මිලට ගැනීමක, ප්‍රදානයක, ත්‍යාගයක, අන්තිම කැමති පත්‍රයකින් බැහැර කිරීමක ප්‍රකාර හෝ අන් ආකාරයකින් සංස්ථාව වෙත සතු කරනු ලැබිය හැකි චංචල හෝ නිශ්චල යම් දේපළක් ගැනීමට හෝ දැරීමට නීතිය අනු ව සංස්ථාවට හැකියාව හා ප්‍රවීණත්වය තිබිය යුතු අතර, ඒ දේපළ විකිණීමේ, උකස් කිරීමේ, බදු දීමේ හුවමාරු කර ගැනීමේ හෝ අන් ආකාරයකින් බැහැර කිරීමේ සම්පූර්ණ බලය සහිත ව එකී සංස්ථාවේ තත් කාලයේ බලපවත්නා රීතිවලට යටත්ව මේ පනතේ කාර්යයන් සඳහා සංස්ථාව විසින් ඒ සියලු දේපළ දැරිය යුතු ය.

8. මේ පනතෙහි අඩංගු කිසිවක් ශ්‍රී ලංකා ජනරජයේ හෝ යම් දේශපාලන මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙන යම් තැනැත්තන්ගේ අයිතිවාසිකම් කෙරෙහි මේ පනතෙහි සඳහන් කරනු ලැබ ඒවා මාර්ගයෙන්, ඒවායින් හෝ ඒවා යටතේ හිමිකම් ඉදිරිපත් කරනු ලබන පරිදි හැර, හානිකර නො විය යුතු ය; නැතහොත් බල නො පෑ යුතු ය. ජනරජයේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

## උපලේඛනය

### I නම හා පරමාර්ථ

1. සංගමය (මෙහි මින් මතු "සංගමය" යනුවෙන් සඳහන් කෙරෙන) "මග්ගොන තරුණ බෞද්ධ සංගමය" යනුවෙන් හැඳින්විය යුතු ය.

2. සංගමයේ පරමාර්ථ පහත සඳහන් පරිදි විය යුතු ය:—

(අ) බෞද්ධයින් අතර අන්‍යොන්‍ය මෛත්‍රිය, සදාචාරය හා සමගිය වර්ධනය කිරීම; බෞද්ධයින්ගේ පොදු සුභසිද්ධිය;

(ආ) බෞද්ධාගම ව්‍යාප්ති කිරීම, බෞද්ධ හා ජාතික අධ්‍යාපනය නැංවීම, බෞද්ධයින්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම;

(ඇ) බෞද්ධයින් විසින් බුද්ධ ධර්මය වඩාත් හොඳින් පිළිපැදීම සඳහා ක්‍රම හා මාර්ග යොදා ගැනීම, බෞද්ධ කටයුතුවලට ආධාර දීම.

### II සංයුතිය

3. සාමාජිකයෝ: සංගමයේ සාමාජිකයන් පහත සඳහන් අයගෙන් සමන්විත විය යුතු ය:—

(අ) යාවජීව සාමාජිකයන්;

(ආ) ගරු සාමාජිකයන්;

(ඇ) සාමාන්‍ය සාමාජිකයන්.

4. නිලධරයෝ: සංගමයේ නිලධරයෝ පහත සඳහන් අය වන්නාහ:—

(අ) සභාපතිවරයකු;

(ආ) සිව් දෙනකුට නො වැඩි උපසභාපතිවරුන් ගණනක්;

(ඇ) ගරු ලේකම්වරයෙක්;

(ඈ) ගරු උප ලේකම්වරයෙක්;

(ඉ) ගරු භාණ්ඩාගාරික;

(ඊ) ගරු විගණකයෙක්;

(උ) 31 (අ) රීතිය යටතේ පත් කරනු ලබන සෑම විශේෂ කමිටුවකම තත් කාලයෙහි සිටින සභාපති;

(ඌ) 31 (අ) රීතිය යටතේ පත් කරනු ලබන සෑම විශේෂ කමිටුවකම තත් කාලයෙහි සිටින ලේකම්;

5. කළමනාකාර මණ්ඩලය: (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් ඇතැම් විට සඳහන් කෙරෙන) කළමනාකාර මණ්ඩලයක් විය යුතු ය. එය පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත වේ:—

(අ) (මෙහි මින් මතු "මණ්ඩලයේ නිලබලයෙන් පත් වූ සාමාජිකයන්" යනුවෙන් ඇතැම් විට සඳහන් කෙරෙන) සංගමයේ සියලු නිලධරයන්;

(ආ) මණ්ඩලයේ සේවය කිරීම සඳහා වාර්ෂිකව තෝරා පත් කරගනු ලබන (නිලධරයන් නො වන) (මෙහි මින් මතු "මණ්ඩලයේ නිල නොලත් සාමාජිකයන්" යනුවෙන් ඇතැම්විට සඳහන් කෙරෙන) අවම සංඛ්‍යාව තිස්පස් දෙනෙකු වත් විය යුතු වෙනත් සාමාජිකයන්.

## III සාමාජිකත්වය

6. වයස අවුරුදු දහ අට සම්පූර්ණ කර සිටින සෑම පුරුෂයකුම හෝ ස්ත්‍රියක්ම සංගමයේ යාවජීව සාමාජිකයකු හෝ ගරු සාමාජිකයකු හෝ සාමාන්‍ය සාමාජිකයකු වීමට සුදුසු වේ.

7. සාමාජිකත්වය සඳහා සුදුසු යම් තැනැත්තකු විසින් ගරු සාමාජිකයකු හෝ සාමාන්‍ය සාමාජිකයකු වශයෙන් ඇතුලත් වීම සඳහා, මණ්ඩලය විසින් අනුමත කරන ලද ආකෘතියක ඉල්ලුම් කළ හැකි අතර ඒ ඉල්ලුම් පත්‍රය අවස්ථාවෝචිත පරිදි ගරු සාමාජිකයකුගේ හෝ සාමාන්‍ය සාමාජිකයකුගේ යටත් පිරිසෙයින් එක් මසකවත් සාමාජික ගාස්තුව සමග ගරු ලේකම් වෙත ඉදිරිපත් කළ යුතු ය. ගරු ලේකම් විසින් ඒ සෑම ඉල්ලුම් පත්‍රයක්ම මණ්ඩලයේ ඊළඟ රැස්වීමෙහි දී මණ්ඩලය ඉදිරියෙහි තැබිය යුතු ය.

8. මණ්ඩලය විසින් එහි අභිමතය පරිදි සාමාජිකත්වය සඳහා වූ ඉල්ලුම් පත්‍රයක් අනුමත කිරීම හෝ අනනුමත කිරීම කළ හැකි ය. ඉල්ලුම් පත්‍රයක් අනනුමත කරනු ලැබූ අවස්ථාවක කිසිම හේතුවක් දක්වීම අවශ්‍ය නොවේ.

9. සංගමයට රුපියල් 250 ට නො අඩු මුදලක් පරිත්‍යාග කරන සෑම තැනැත්තකු කළම්නාකාර මණ්ඩලය විසින් එහි පරම අභිමතය අනුව සංගමයේ යාවජීව සාමාජිකයකු වශයෙන් තෝරා පත් කරගත හැකි ය. එසේ තෝරා පත් කරගනු ලැබූ සෑම තැනැත්තකුම සංගමයේ යාවජීව සාමාජිකයකු වන්නේ ය.

10. සාමාජික ගාස්තු—

(අ) ගරු සාමාජිකවරුන්ට, මසකට රුපියල් එකක හෝ වර්ෂයකට රුපියල් දහයක අඩුම මුදලක් ;

(ආ) සාමාන්‍ය සාමාජිකයන්ට මසකට සත විසිපහක හෝ වර්ෂයකට රුපියල් තුනක අඩුම මුදලක්

විය යුතු ය.

## IV සාමාජිකත්වය අහිමිවීම

11. මරණයෙන් සංගමයේ සාමාජිකත්වය අවසන් වේ.

12. යම් සාමාජිකයකු විසින් හය මාසයක කාලපරිච්ඡේදයක් තුළ තම සාමාජික ගාස්තු නොගෙවා හරිනු ලැබ ඇති අවස්ථාවක, ඒ සියලු හිඟ මුදල් ගෙවන තුරු සාමාජිකත්වයේ යම් වරප්‍රසාද භුක්ති විඳීම ඔහුට අහිමි විය යුතු ය. එසේ වුව ද වැඩිදුරට වූ හය මාසයක කාලපරිච්ඡේදයක් ඇතුළත ඒ සියලු හිඟ මුදල් ගෙවීම ඔහු පැහැර හරින්නේ නම් ඔහුගේ සාමාජිකත්වය ඉක්බිතිව අවසන් වන අතර 13 වන රීතියට යටත්ව ඉල්ලුම් කිරීමෙන් පසු සාමාජිකත්වය ඔහුට නැවත ලබා ගත හැකි ය.

13. 12 වන රීතිය යටතේ, සාමාජිකත්වය අවසන් වූ යම් තැනැත්තකු ඔහු සාමාජිකයකු ව සිටිය දී ඔහු විසින් නො ගෙවා හිඟ තබන ලද සියලු සාමාජික ගාස්තු පළමුවෙන් ගෙවා ඇත්තේ නම් මිස සාමාජිකත්වය සඳහා ඉල්ලුම් කිරීමට සුදුසු නො විය යුතු ය.

14. පාලක මණ්ඩලයේ මතය අනු ව යම් සාමාජිකයකුගේ හැසිරීම සංගමයේ පරමාර්ථවලට පටහැනි නම් හෝ සංගමයේ ගෞරවය හෝ ගරුත්වයට අහිතකර ලෙස බලපායි නම් හෝ සංගමයේ ප්‍රගතියට බාධාවක් නම් පාලක මණ්ඩලය විසින් ඒ කාර්යය සඳහා කැඳවනු ලැබූ විශේෂ මහා සභා රැස්වීමක දී යෝජනා සම්මත යක මාර්ගයෙන් ඒ සාමාජිකයාගේ සාමාජිකත්වය අත්හිටුවීම හෝ ඔහු සාමාජිකත්වයෙන් ඉවත් කිරීම කළ හැකි ය:

එසේ වුව ද තත් කාලයෙහි මණ්ඩලයේ සිටින සාමාජික සංඛ්‍යාවෙන් අඩුම වශයෙන් අඩක්වත් ඒ යෝජනාවට පක්ෂව හෝ විපක්ෂව ඡන්දය දී තිබිය යුතු ය.

15. ඕනෑම සාමාජිකයකු විසින් ගරු ලේකම් වෙත යැවෙන ලිපියක මාර්ගයෙන් සංගමයේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම ඉදිරිපත් කළ හැකි අතර, ඒ හැම ලිපියක් ම පාලක මණ්ඩලයේ ඊළඟ රැස්වීමෙහි දී ඒ මණ්ඩලය ඉදිරියෙහි තැබිය යුතු ය. මණ්ඩලය විසින් ඔහුගේ ඉල්ලා අස්වීම භාර ගැනීමෙන් පසු ඒ සාමාජිකයා සංගමයේ සාමාජිකයකුව සිටීම අවසන් විය යුතු ය.

16. ගෙවීමෙන් පසු කිසිම සාමාජික ගාස්තුවක් හෝ ඉන් කොටසක් කවර හෝ හේතුවක් නිසා කිසි තැනැත්තකුට ආපසු නො ගෙවිය යුතු ය.

## V දේපල හා අරමුදල් පිළිබඳ පාලනය හා පරිපාලනය

17. සංගමයට ගෙවිය යුතු සියලු මුදල් ගරු භාණ්ඩාගාරික වෙත ගෙවිය යුතු ය. පාලක මණ්ඩලයේ අනුමතියට යටත්ව ගෙවීම් කිරීම සඳහා ගරු භාණ්ඩාගාරිකට මෙයින් බලය පවරනු ලැබේ.

18. පෙරාතුව වූ රීතිවල කුමක් පටහැනිව තිබුණ ද එය නොතකා ගරු භාණ්ඩාගාරික විසින් යම් ලිත් මාසයක් තුළ, සමස්තය රුපියල් හත්තෑපහකට නො වැඩි වන්නේ නම් ඒ ගෙවීම සඳහා මණ්ඩලයේ පූර්ව අනුමතිය නො ලබා සංගමය වෙනුවෙන් එහි මුදල්වලින් ගෙවීම් කළ හැකි අතර එක් ලිත් මාසයක් තුළ සමස්තය රුපියල් විසිපහකට නොවැඩි මුදලක් සංගමය වෙනුවෙන් වියදම් කිරීමට ගරු ලේකම්ට මෙයින් බලය පවරනු ලැබේ.

19. ඒ කාර්යය සඳහා මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ බැංකුවක සංගමයේ නාමයෙන් වූ ගිණුමක සංගමයේ සියලු මුදල් අයුක්ති සහගත ප්‍රමාදයකින් තොරව තැන්පත් කළ යුතු අතර ඒ ගිණුම, නිලධරයන් දෙදෙනෙකු විසින් එනම් සභාපති හා මණ්ඩලයේ තීරණය අනු ව ගරු ලේකම් හෝ ගරු භාණ්ඩාගාරික හෝ විසින් ක්‍රියාත්මක කළ යුතු ය.

20. පෙරාතුව වූ රීතිවල පටහැනිව කුමක් සඳහන් වුව ද එය නොතකා ගරු භාණ්ඩාගාරික විසින් සංගමයේ මුදල්වලින් යම් නියමිත කාලයක් තුළ රුපියල් 100 සම්පූර්ණ මුදලක් ඔහු ළඟ රඳවා තබාගත හැකි අතර ගරු ලේකම් විසින් යම් නියමිත කාලයක් තුළ රුපියල් 51 සම්පූර්ණ මුදලක් රඳවා තබා ගත හැකි ය.

21. සාමාජිකත්ව නාමලේඛනය යනුවෙන් හඳුන්වනු ලබන ඒ කාර්යය සඳහා විශේෂයෙන්ම තබන ලද පොතක සියලු සාමාජික ගාස්තු ගෙවීම් නොපමාව වාර්තාගත කළ යුතු ය. ගරු භාණ්ඩාගාරික විසින් භාරගත් සියලු මුදල් සඳහා සංගමය වෙනුවෙන් ඔහු විසින් ලදුපත් නිකුත් කළ යුතු ය.

22. කළමනාකාර මණ්ඩලයේ සෑම මාසික රැස්වීමක දීම ගරු භාණ්ඩාගාරික විසින් කලින් වූ ලිත් මාසයේ සංගමයේ විගණනය කරන ලද ගිණුම් ප්‍රකාශයක් මණ්ඩලය ඉදිරියේ තැබිය යුතු ය.

23. කළමනාකාර මණ්ඩලය විසින්, සංගමය වෙනුවෙන් චංචල දේපල පිළිබඳ අයිතිය හෝ අන් සම්බන්ධතා විකිණීමෙන්, පරිත්‍යාග කිරීමෙන්, බදුදීමෙන්, උකස් කිරීමෙන්, හුවමාරු කිරීමෙන් හෝ අන් ආකාරයකින් හෝ අත්කර ගැනීම, බැහැර කිරීම හෝ ඇතිකර ගැනීම එහි අභිමතය පරිදි කළ හැකි ය.

24. කළමනාකාර මණ්ඩලය විසින් සංගමය වෙනුවෙන් ඉඩම් හෝ අන් නිශ්චල දේපල පිළිබඳ අයිතිය හෝ අන් සම්බන්ධතා විකිණීමෙන්, පරිත්‍යාග කිරීමෙන් හෝ බදුදීමෙන්, උකස් කිරීමෙන්, හුවමාරු කිරීමෙන් හෝ අන් ආකාරයකින් අත්කර ගැනීම, බැහැර කිරීම හෝ ඇති කරගැනීම එහි අභිමතය පරිදි කළ හැකි ය. එසේ වුව ද මහා සභා රැස්වීමක දී, ඒ රැස්වීමට පැමිණි සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නො අඩු වැඩි ඡන්දයෙන් විශේෂ යෝජනාවක් සම්මත කිරීමෙන් කලින් බලය පවරා ඇත්නම් මිස ඒ අත්කර ගැනීමට, බැහැර කිරීමට හෝ ඇති කර ගැනීමට යම් නීත්‍යනුකූල බලයක් හෝ වලංගුතාවක් නො තිබිය යුතු ය.

25. යම් ඉඩමක් හෝ අන් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් යම් ස්ථිර වැඩි දියුණු කිරීමක් කරවීම හෝ කිරීම සඳහා යම් ලිත් මාසයක් ඇතුළත රුපියල් 250 කට නො වැඩි මුදලක් හැර සංගමයේ කිසිම මුදලක්, සංගමයේ යම් මහා සභා රැස්වීමකට පැමිණි සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නො අඩු වැඩි ඡන්දයෙන් යෝජනා සම්මත කිරීමෙන් ඒ රැස්වීමේ දී ඒ වියදම සඳහා කලින් බලය පවරනු ලැබ ඇත්නම් මිස වියදම් නො කළ යුතු ය.

26. සංගමයේ රීතිවලට යටත් ව සංගමයේ චංචල හා නිශ්චල සහ දෙවර්ගයේම දේපළ පාලනය හා පරිපාලනය කළමනාකාර මණ්ඩලය වෙත සතු කළ යුතු ය.

## VI නිලධරයෝ

27. 4 (අ) සිට (ඊ) දක්වා වූ රීතිවල සඳහන් නිලධරයන් එක් එක් වර්ෂයේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී තෝරා පත් කළ යුතු අතර ඔවුන් කලින් ධුර අත්හැර යන්නේ නම් මිස, එසේ පත්කර ගනු ලැබීමෙන් පසු ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීමේ දී ඒ ධුරවලට තැනැත්තන් තෝරා පත්කර ගන්නා තුරු ධුර දැරිය යුතු ය.

28. 4 (අ) සිට (ඊ) දක්වා වූ රීතිවල සඳහන් නිලධරයකු පහත සඳහන් අවස්ථාවන්ගෙන් යම් අවස්ථාවක දී ධුරය අත්හැර ගිය සේ සලකනු ලැබිය යුතු ය:—

(අ) සංගමයේ සාමාජිකත්වය අහිමි වීම;

(ආ) ගරු ලේකම් හෝ සභාපති වෙත යැවෙන ලිපියකින් ධුරයෙන් ඉල්ලා අස්වීම පාලක මණ්ඩලය විසින් පිළිගැනීමෙන් පසු.

29. 4 (අ) සිට (ඊ) දක්වා වූ රීතිවල සඳහන් නිලධරයකු පෙරාතුව වූ රීතිය යටතේ ධුරය අත්හැරිය විට හා ඒ පුරප්පාඩුව පිරවීම අවශ්‍ය යයි මණ්ඩලය සලකන විට ඒ කාර්යය සඳහා විශේෂයෙන් කැඳවනු ලැබූ විශේෂ මහා සභා රැස්වීමක දී ඒ පුරප්පාඩුව පිරවීම සඳහා අතුරු ඡන්ද විමසීමක් පැවැත්විය යුතු ය. තව ද ඒ ධුරය පුරවන සාමාජිකයකු විසින්, ඔහු කලින් ධුරය අත්හැර යන්නේ නම් මිස ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීමේ දී නිලධරයන් තෝරා පත්කර ගන්නා තෙක් ධුරය දැරිය යුතු ය.

## VII කළමනාකාර මණ්ඩලය

30. සංගමයේ කටයුතු පිළිබඳ පාලනය හා කළමනාකාරිත්වය, සංගමයේ රීතිවලට යටත් ව, කළමනාකාර මණ්ඩලය විසින් ඉටු කළ යුතු ය. එසේ වුව ද තත් කාලයෙහි මණ්ඩලය සමන්විත වන සාමාජික සංඛ්‍යාව විස්සකට අඩු නො විය යුතු ය.

31. කලින් වූ රීතියෙහි අඩංගු කිසිවක් ගැන නොතකා පහත සඳහන් කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට කළමනාකාර මණ්ඩලයට මෙයින් බලය පවරනු ලැබේ:—

(අ) යම් විස්තර කෙරුණු කාර්යයක් සඳහා විශේෂ කමිටුවක් වශයෙන් සංගමයේ යම් සාමාජිකයකු හෝ යම් සාමාජිකයන් පත් කිරීම හා ඒ කමිටුවේ සභාපති හා ලේකම් පත් කිරීම;

(ආ) වර්ෂය තුළ දී කළමනාකාර මණ්ඩලයේ ම නිල නො ලත් සාමාජිකත්වය සම්බන්ධයෙන් ඇති වන යම් පුරප්පාඩුවක් ඒ ධුරයේ ගත නො වූ කාලය සඳහා පිරවීම;

(ඇ) සංගමයේ යම් සාමාජිකයකු මණ්ඩලයේ සාමාජිකයකු ලෙස තෝරා ගැනීම.

## VIII රැස්වීම්

32. සංගමයේ මහා සභා රැස්වීමක්—

(1) සාමාන්‍ය මහා සභා රැස්වීමක්,

(2) විශේෂ මහා සභා රැස්වීමක්, හෝ

(3) වාර්ෂික මහා සභා රැස්වීමක්

විය යුතුය.

33. සෑම මහා සභා රැස්වීමකටම අවම වශයෙන් දින හතකට කලින් සංගමයේ සෑම සාමාජිකයකු වෙත ම ඒ රැස්වීමේ වේලාව, ස්ථානය හා න්‍යාය පත්‍රය පිළිබඳව දැනුම් දිය යුතු ය.

34. මහා සභා රැස්වීමක් සඳහා ගණපූරණය—

(අ) සභාපති හෝ එක් උපසභාපතිවරයෙක් හා

(ආ) ගරු ලේකම් හෝ ගරු උප ලේකම්

ඇතුළු ව විසි එකක් විය යුතු ය.

35. සංගමයේ මහා සභා රැස්වීමක් පැවැත්වීම අවශ්‍ය යැයි කළමනාකාර මණ්ඩලය සම්මත කරන කවර අවස්ථාවක වුව ද සාමාන්‍ය මහා සභා රැස්වීමක් යැයි හැඳින්වෙන ඒ රැස්වීම පැවැත්විය යුතු ය. එසේ වුව ද මණ්ඩලය විසින් සෑහෙන හේතුවක් පිට අන් ආකාරයකින් සම්මත කරන්නේ නම් මිස සාමාන්‍ය මහා සභා රැස්වීම් එකක් පමණක් යම් ලිත් මාසයක් තුළ පැවැත් විය යුතු අතර ඒ රැස්වීම මාසයේ තුන්වන ඉරු දින අපර භාගයේ පැවැත්විය යුතු ය.

36. සංගමයේ සාමාජිකයන් පහළොස් දෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින් ගරු ලේකම් වෙත යැවෙන ලිපියක මාර්ගයෙන්, ඒ ලිපියෙහි දැක්විය යුතු යම් කාර්යයක් පිළිබඳව ක්‍රියා කිරීම සඳහා සංගමයේ මහා සභා රැස්වීමක් පවත්වන ලෙස ඉල්ලිය හැකි අතර, ඒ ලිපිය තමා වෙත ලැබී දින විසිඑකක් ඇතුළත වූ දිනයක ඒ රැස්වීම ගරු ලේකම් විසින් කැඳවිය යුතු ය. ඒ දිනය පිළිබඳව සාමාජිකයන් වෙත නිවේදනය කිරීම ඒ ලියවිල්ල ලැබී දින දහයක් ඇතුළත සම්පූර්ණ විය යුතුවාක් මෙන්ම එසේ කිරීමට ගරු ලේකම් පැහැර හැරියහොත් ඒ ලියවිල්ල අත්සන් කළ හෝ නො කළ සාමාජිකයන් පහළොස් දෙනෙක් හෝ වැඩි ගණනක් විසින්, 33 වන රීතියට යටත්ව ගරු ලේකම්ට ලිපිය ලැබී දින විසිඑකක් ඇතුළත වූ දිනයක ඒ රැස්වීම කැඳවිය හැකි ය. මේ රීතිය යටතේ පවත්වනු ලබන රැස්වීමක් විශේෂ මහා සභා රැස්වීමක් ලෙස හඳුන්වනු ලැබේ.

37. සංගමයේ වාර්ෂික මහා සභා රැස්වීම එක් එක් වර්ෂයේ ජූලි මාසයෙහි හෝ අගෝස්තු මාසයෙහි පැවැත්විය යුතු අතර එහි න්‍යාය පත්‍රයට—

(1) 4(අ) සිට (ඊ) දක්වා වූ රීතිවල සඳහන් නිලධරයන් තෝරා පත් කර ගැනීම;

(2) මණ්ඩලයේ නිල නොලත් සාමාජිකයන් ලෙස අවම වශයෙන් සාමාජිකයන් තිස් පස් දෙනෙකුවත් තෝරා පත් කර ගැනීම;

(3) ගත වූ වර්ෂයේ සංගමයේ වාර්ෂික වාර්තාව හා වාර්ෂික ගිණුම් ප්‍රකාශනය සලකා බැලීම

ඇතුළත් විය යුතු ය.

38. මහා සභා රැස්වීමක දී යෝජනා කරනු ලබන යම් යෝජනාවක් පිළිබඳ දැන්වීමක් එහි අඩංගු කරුණු පිළිබඳ පිටපතක් සමග කළමනාකාර මණ්ඩලයේ ඊළඟ රැස්වීමට යටත් පිරිසෙයින් දින දහහතරකටවත් කලින් ගරු ලේකම් වෙත භාර දිය යුතු අතර ඒ සෑම යෝජනාවක් ම මණ්ඩලයේ අනුමතිය සඳහා මණ්ඩලය ඉදිරියෙහි තැබිය යුතු ය.

39. කලින් වූ 38 වන රීතිය යටතේ මණ්ඩලය ඉදිරියට එන සෑම යෝජනාවක්ම මණ්ඩලය විසින් සලකා බැලිය යුතු අතර යෝජනාකරු හෝ ස්ථිරකරු මණ්ඩලයේ සාමාජිකයකු නො වන අවස්ථාවක අවස්ථාවෝචිත පරිදි ඔහුට හෝ ඔවුන්ට යෝජනාව වෙනුවෙන් මණ්ඩලය ඉදිරියෙහි කථා කිරීමට අවසරය තිබිය යුතු ය.

40. කලින් සඳහන් 38 හා 39 වන රීතිවල විධිවිධාන අනුව ක්‍රියා කර ඇත්තේ නම් මිස හා ඒ යෝජනාව මහා සභා රැස්වීමක දී ඉදිරිපත් කිරීමට මණ්ඩලය විසින් අනුමතිය දී ඇත්තේ නම් මිස කිසිම යෝජනාවක් මහා සභා රැස්වීමක දී ඉදිරිපත් නො කළ යුතු ය.

41. කළමනාකාර මණ්ඩලයේ රැස්වීමක්—

(අ) මාසික රැස්වීමක්, හෝ

(ආ) අතිවිශේෂ රැස්වීමක්, හෝ

(ඇ) හදිසි රැස්වීමක්, හෝ

(ඈ) විශේෂ රැස්වීමක්

විය යුතු ය.

42. කළමනාකාර මණ්ඩලය සෑම ලිත් මාසයකටම වරක් රැස්විය යුතු අතර සභාපති විසින් සෑහෙන හේතුවක් නිසා අන් ආකාරයකින් විධාන කරන්නේ නම් මිස ඒ රැස්වීම සංගමයේ රැස්වීම් ශාලාවේ දී මාසයෙහි පළමුවන දින අපරභාග 3.00 ට පැවැත්විය යුතු ය. මේ රීතිය යටතේ වූ රැස්වීමක් මාසික රැස්වීමක් ලෙස හඳුන්වනු ලැබේ.

43. යම් කිසි හේතුවක් නිසා අනුක්‍රමික මාස දෙකක් තුළ මාසික රැස්වීම කැඳවීම ගරු ලේකම් විසින් පැහැර හැරියහොත් ඒ මාසික රැස්වීම කැඳවා පැවැත්වූයේ නම් කළ හැකි ව තුබූ කටයුතු කිරීම සඳහා අතිවිශේෂ රැස්වීමක් ලෙස හැඳින්වෙන මණ්ඩලයේ රැස්වීමක් සභාපති විසින් කැඳවිය හැකි ය.

44. ඊළඟ මාසික රැස්වීම තෙක් මණ්ඩලය විසින් යම් කරුණක් සලකා බැලීම තම මතය අනුව පමා කිරීම නො කළ යුතු යයි සභාපති සිතන අවස්ථාවක හදිසි රැස්වීමක් යයි හැඳින්වෙන මණ්ඩලයේ රැස්වීමක් ඔහු විසින් කැඳවිය හැකි ය.

45. මණ්ඩලයේ සාමාජිකයන් දහදෙනකු හෝ වැඩි දෙනකු විසින් ගරු ලේකම් වෙත යැවෙන ලිපියකින්, ඒ ලිපියෙහි නිශ්චිත ව සඳහන් කෙරෙන යම් කාර්යයක් සම්බන්ධයෙන් කටයුතු කිරීම සඳහා මණ්ඩලයේ රැස්වීමක් පවත්වන ලෙස ඉල්ලා සිටිය හැකි ය. ඒ ලිපිය ලැබුණු වහාම මණ්ඩලයේ රැස්වීමක් කැඳවීම ගරු ලේකම්ගේ යුතුකම විය යුතු අතර ඒ රැස්වීම මණ්ඩලයේ විශේෂ රැස්වීමක් ලෙස හඳුන්වනු ලැබේ.

46. හදිසි රැස්වීමක් නොවන මණ්ඩලයේ සෑම රැස්වීමකටම අඩුම වශයෙන් දින තුනකට වත් කලින් මණ්ඩලයේ සෑම සාමාජිකයකුට ම ඒ රැස්වීම පවත්වන වේලාව, ස්ථානය හා එහි න්‍යාය පත්‍රය පිළිබඳව ලියවිල්ලකින් නිවේදනය කළ යුතු ය.

47. මණ්ඩලයේ හදිසි රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනකු විය යුතු අතර, අන් කිසි රැස්වීමක් සඳහා සාමාජිකයන් එකොළොස් දෙනකු විය යුතු ය.

48. මණ්ඩලයේ යම් රැස්වීමක දී යෝජනා කරනු ලබන යෝජනාවක අඩංගු කරුණු සමග ඒ යෝජනාව පිළිබඳ පූර්ව දැන්වීම යටත් පිරිසෙයින් දින හතකටවත් කලින් ලේකම් වෙත ලැබී ඇත්නම් මිස, ඒ කිසිම යෝජනාවක් යෝජනා නො කළ යුතු ය.

49. 48 වන රීතියේ විධිවිධාන නො තකා, මණ්ඩලයේ රැස්වීමක මූලාසනය දරන තැනැත්තා විසින්, කලින් වූ 48 වන රීතියට අනුකූල නො වන යෝජනාවක්, ඒ යෝජනාවේ විෂය පිළිබඳව ඇති වැදගත් භාවයේ හෝ අවශ්‍යතාවයේ හේතුව නිසා යෝජනා කිරීමට රැස්වීම පැවැත්වෙද්දී අවසර දිය හැකි අතර, ඉක්බිතිව ඒ යෝජනාව යෝජනා කරනු ලැබිය යුතු ය.

50. මණ්ඩලයේ සෑම රැස්වීමක දීම හා සංගමයේ සෑම මහා සභා රැස්වීමක දීම ඒ රැස්වීම පවත්වාගෙන යා යුතු ආකාරය හෝ සංගමයේ රීතිවල අර්ථකථනය කිරීම හෝ ඒ රැස්වීමේ දී යම් විශේෂ කරුණක් සම්බන්ධයෙන් කටයුතු කිරීමේ යෝග්‍යතාව පිළිබඳව තීරණයක් කිරීමට ඒ රැස්වීමේ මූලාසනය දරන තැනැත්තාට බලය තිබිය යුතු අතර, ඒ තීරණය පිළිගැනීමට සංගමයේ සියලුම සාමාජිකයන් බැඳී සිටිය යුතු ය.

51. සභාපති විසින්, තමා පැමිණ සිටින සෑම රැස්වීමක ම මූලසුන දැරිය යුතු ය. ඔහු නො පැමිණ සිටියහොත් උපසභාපතිවරයකු විසින් මූලාසනය දැරිය යුතු ය. සභාපති හා සියලුම උපසභාපතිවරුන් නො පැමිණ සිටියහොත් රැස්වීමේ සාමාජිකයන් විසින් තෝරා ගනු ලබන සාමාජිකයකුට මූලාසනය දැරිය හැකි ය.

## IX විවිධ කරුණු

52. සංගමයේ වර්ෂය එක් එක් වර්ෂයේ ජූලි මස පළමුවන දිනයෙන් ආරම්භ වී ඊළඟ වර්ෂයේ ජූනි මස තිස්වන දිනෙන් අවසන් විය යුතු ය.

53. සංගමයේ මහා සභා රැස්වීමකට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකක වැඩි ඡන්දයෙන් සම්මත කෙරෙන යෝජනාවක මාර්ගයෙන්, ඒ රැස්වීම පිළිබඳව දින විසිඅටකටවත් දැන්වීමක් කර ඇත්තේ නම්, අලුත් රීති සෑදීමේ, එවකටත් බල පවත්නා යම් රීතියකට යමක් එකතු කිරීමේ, එය වෙනස් කිරීමේ, සංශෝධනය කිරීමේ හෝ අවලංගු කිරීමේ බලය සංගමයට තිබිය යුතු ය.

54. ගරු ලේකම් වෙත අඩුම වශයෙන් දින හතකට පෙර ඒ වෙනුවෙන් ඉල්ලීමක් ඉදිරිපත් කර සිටින සංගමයේ සෑම සාමාජිකයකු ම විසින්, ඒ ඉල්ලීමේ නිශ්චිතව සඳහන් කර තිබිය යුතු සංගමයේ යම් පොතක්, ලිපිගොනුවක් හෝ ලිපි ගනුදෙනුවක් පරීක්ෂා කර බැලිය හැකි ය.

*1——ඒ 00098 (73/8)

ජාතික රාජ්‍ය සභාවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 30 කි. (විදේශීය) රු. 40 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය. මුදල් ගෙවූ දිනට කලින් නිකුත් කරන ලද පනත් කෙටුම්පත් සහ නීති නොසැපයීමේ කොන්දේසිය මත ප්‍රමාද දායක මුදල් භාරගනු ලැබේ.